# යහපාලනය තීරණාත්මක පරීක්ෂාවක් අබියස

චාමර ලක්ෂාන් කුමාර

අන්ත දූෂිත ඒකාධිපති පාලනයකට තිත තබමින් මේ රටේ, ජනතාව ස්වෙච්ඡාවෙන් බලමුළුගැන්ව මහපොළොවේ ඇත්තක් බවට පත්කළ ජනවාරි අට නිහඬ විප්ලවය තම දෙවන වසර සම්පූර්ණ කරනු ලබයි. එම කඩඉම් සම්පූර්ණය යහපාලන රජයේ පසුගිය ක්‍රියාකාරීත්වය දෙස අතීතාවර්ජනයක් කිරීමේ, අවස්ථාව අපට ලබා දෙයි. පසුගිය දෙවසරක කාලය පිළිබඳ ආපසු හැරී බැලීමක් සිදුකිරීමේදී මූලිකවම අපට එය කිරීමට සිදු වනුයේ පෙර පැවැති රාජපක්ෂ පාලනය සමග සසඳමිනි. ඒ අනුව ගෙන බලද්දී බැලූ බැල්මටම පැහැදිලි සාධනීය වෙනසක් රට තුළ සිදුව තිබේ. දේශපාලන අගතිගාමීත්වයෙන් තොරව කුහක නොවී බැලූවහොත් එය ප්‍රශ්න විරහිතය. ඒ පිළිබඳ ඇති එකම ගැටලුව වනුයේ සිදුව ඇති වෙනස එදා යහපාලන කඳවුර වෙනුවෙන් පොදි බැඳි ජනතාව අපේක්ෂා කළ වෙනස ම ද යන්න ය.

දස වසරක් බලයේ සිටි කිසිදා පැරදවිය නොහැකියැයි ඇතැමුන් කියූ මහින්ද රාජපක්ෂව, ගෙදර යැවීමේ දී සාතිශය බහුතරයක් ජනතාව තුළ දැල්වුණු බලාපොරොත්තුව අතිශයින්ම දේශපාලනික වූවක් විය. කුසට ආහාරයක්, ඉනට වස්ත්‍රයක් වැනි ආර්ථිකමය අවශ්‍යතා වෙනුවට ඒ තුළ ගොනුව පැවැතියේ යහපාලනය, ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස වැනි දේශපාලනික කාරණාය. බඩු මිල අඩු කිරීම, වැටුප් වැඩි කිරීම, වැනි දෑ එහිදී ද්විතියික වුණි. දෛනික ජීවිතය පවත්වාගෙන යාමේදී ඒවා වැදගත් වුවද රටේ ජනතාව තම ප්‍රමුඛතා ලැයිස්තුව තුළ ඊට වඩා ඉහළින් නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, වැනි කාරණා ස්ථානගත කර තිබිණි. නීතිය වෙනුවට අවනීතිය, යහපාලනය වෙනුවට යම පාලනය රජ කළ ඒ භීම සමයට තිත තබමින්, රටේ ජාතික ධනය සොරා කෑ හොරුන්ට, දූෂිතයන්ට දඬුවම් ලබා දෙමින් නව යුගයක් කරා රට ගමන් කරනු දැකීම වෙනසක් වෙනුවෙන් 2015 ජනවාරි 08 වැනි දින පෙනී සිටීම් කළ ජනතාවගේ හදවතේ ගැඹුරුම තැනින් දැල්වුණු ප්‍රාර්ථනාව විය. ණීයහපාලන වෙනස සිදුව වසර දෙකක් ගතවන තැන එහි ශේෂ පත්‍රය පිරික්සත්දී මේ සියලු කාරණා දෙස අප අවධානය යොමුකර බැලීම වැදගත්ය.

සංවත්සර සැමරුම් සිදු කරමින්, ජනතා බදු මුදල් කොල්ලකෑම විලාසිතාවක්ව පැවැති සංස්කෘතියක් තුළ, වැඩිපුර අණබෙර නොගසමින් ප්‍රීති උත්සව නොපවත්වමින් බල හුවමාරුවේ තෙවන වසරට පිවිසීම සම්බන්ධයෙන් පළමුකොටම ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයාට මල් මිටක් පිරිනැමීමට කැමැත්තෙමු. වසර 2ක් තුළ සිදුව ඇති වෙනස පිළිබඳ කථා කිරීමේදී දේශපාලන ප්‍රතිසංස්කරණ සිදුකිරීම අතින් වත්මන් පාලනය සෑහෙන දුරක් ගමන් කර තිබේ. තොරතුරු දැනගැනීමේ පනත, ස්වාදීන කොමිෂන් සභා මේ වන විට ප්‍රායෝගික ඇත්තක් වී ඇත. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය පසුගිය ජනවාරියේදී දියත් කිරීම වැනි ක්‍රියාමාර්ග ඔස්සේ මානව අයිතිවාසිකම් සුරැකීම සම්බන්ධයෙන් වන තම උනන්දුව රජය පෙන්වා තිබේ. මේ සියලු තත්ත්වයන් තුළ පෙරට වඩා පැහැදිලි වෙනසක් රට තුළ සිදුව ඇත. ජනාධිපති ලේකම් කාර්යාලයේ ගේට්ටුව කඩාගෙන යෑමට ඊට ඇතුළුවීමට උත්සාහ කිරීම දක්වා වූ නිදහසක් රටවැසියන්ට ලැබී ඇත. **රජය හෝ ජනාධිපතිවරයා විවේචනය කළා යැයි සුදු වෑන් හඹා ආ බවක් පසුගිය කාලයේ අසන්නට නොමැත.** ඒ අර්ථයෙන් යම් මට්ටමක නිදහසක් රට තුළ තහවුරු වී ඇති මුත්, ජනතාව අපේක්ෂා කළේ එය පමණක් ද? ගැටලුව ඇත්තේ එතැනයි. ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස රට තුළ තහවුරු වීමට සමගාමීව රාජපක්ෂ සමයේ නොපනත්කම්හි නිරත වූ දූෂිතයන්ට එරෙහිව පැහැදිලිව පිටතට පෙනෙන ආකාරයෙන් නීතිය ක්‍රියාත්මක වනු ඇතැයි ජනතාව අපේක්ෂා කළ ද ඒ සම්බන්ධයෙන් සතුටු විය හැකි තත්ත්වයක් තවම රට තුළ දැකගත නොහැකි වීම බලාපොරොත්තු කඩකරවයි. භීෂණය නිම කිරීම සම්බන්ධයෙන්ˮ සාමර්ථ්‍යයක් ලබාගෙන ඇතිමුත් දූෂණයට තිත තැබීම සම්බන්ධ ප්‍රතිඵලනම් කිසිසේත්ම අවශ්‍යතාව හා සමපාත නොවේ.

රාජපක්ෂවරුනට හා ඔවුන්ගේ අන්තේවාසිකයන්ට එරෙහිව පොදු අපේක්ෂකයාගේ කඳවුර එදා දමා ගැසූ ප්‍රධාන මිසයිල වූයේ නාස්තිය වංචාව, දූෂණයයි. එහෙත් තවමත් ඒ සම්බන්ධව ප්‍රමාණවත් ඔප්පු කිරීමක් සිදුකර ගැන්මට නොහැකි වීම එදා උස් හඬින් නැගූ එම චෝදනාවන්හි සුජාතභාවය ප්‍රශ්න කරයි. සුපැහැදිලිවම මෙය බරපතළ තත්ත්වයකි. ඇස්පනා පිට මහජන මුදල් කොල්ල කෑමේ යෙදුණු ඇතැම් දූෂිතයන්ට එරෙහිව නඩු පැවරීමටවත් කොන්දක් නොමැති වීම සම්බන්ධයෙන් යහපාලන වෙනස සමග සිටගත් ජනතාව තුළ ඇත්තේ පහන් හැඟීමක් නොවේ. 2015 ජනවාරි 08 වැනි දින පරාජයට පත්වූයේ මහින්ද රාජපක්ෂ නමැති තනි පුද්ගල සාධකය පමණක් නොවේ. ඒ සමග එම ජරාජීර්ණ ක්‍රමය ද පරාජයට පත් විණි. ජනවාරි අට වැනිදා ජනවරම හිමි වූයේ, ඊට කොකා පෙන්වූවන් හුරතල් කිරීමට නොවේ. මෙය වත්මන් පාලකයන් තේරුම් ගැනීම වැදගත්ය. තනතුරු, වරදාන අපේක්ෂාවෙන් දේශපාලන අස්ථානයන් මාරු කළා ය කියා නීතිය නැමීමක් සිදුවන්නේ නම්, එය කිසිසේත්ම පිළිගත හැකි සාධාරණකරණය කළ හැකි තත්ත්වයක් නොවේ. ඊළඟ රැල්ල, හොරුන්ට මෙන්ම හොරු ආරක්ෂා කළවුන්ට එරෙහිව ද නැගිය හැකි බව අදාළ වගකිවයුත්තන් මෙහිදී තේරුම්ගත යුතුය. අනෙක් අතට දූෂිතයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොවීම හා එය සෑහෙන පමාවීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා වෙත ඇඟිල්ල දිගු කිරීමද සාධාරණ නොවේ. ඊට වඩා වෙනස් යමක් මෙහිදී දැකගත හැකිය. රටක ආණ්ඩුකරණය තුළ අතිශය වැදගත් අංශ ලෙස සැලකෙන හමුදාව, පොලීසිය, බුද්ධි අංශය තුළ පමණක් නොව අධිකරණ හා පරිපාලන ක්ෂේත්‍ර තුළ ද පාලනය, ආණ්ඩුව වෙතින් ගිලිහී ගොස් තිබීම මේ තත්ත්වය නිර්මාණය වීමට සෑහෙන දුරට බලපා තිබේ. එම අංශ අද රාජපක්ෂ හිතවාදීන්ගේ ග්‍රහණයට ලක්ව ඇති බව පෙනෙන්නට ඇත. ගෝඨාභය රාජපක්ෂ, සරත් නන්ද සිල්වා, හා ලලිත් වීරතුංගගේ ණීගෝලයන්ඳ රැසක් පාලන තන්ත්‍රයේ ඉහළ වගකීම් හොබවමින්, තම ස්වාමිවරුනගෙන් ලැබෙන අණ, දේව වාක්‍යයක් සේ ක්‍රියාත්මක කරමින් සිටිති. රාජපක්ෂලාට විරුද්ධව හදවතින්ම විරුද්ධ වී, නිර්භයව තීන්දු තීරණ ගත හැකි අය වෙනුවට අද බොහෝ වැදගත් තැන්වල ඉහළ පුටු හොබවනුයේ ඔවුන්ගේ හෙංචයියන්ය. මෙහි තවත් පැත්තක් ද ඇත.

සාමාන්‍යයෙන් ක්‍රිකට් ක්‍රීඩාවේදී නම් පන්දු රකින කණ්ඩායම ම පන්දුවට පහර දිය යුතු මුත්, යහපාලන වෙනස සිදුවීමෙන් අනතුරුව නම් දැකගත හැක්කේ ඊට වෙනස් තත්ත්වයකි. එහිදී පන්දු රකින ලද පන්දු යැවූ පිරිස වෙනුවට වෙනත් පිරිසක් පන්දුවට පහර දෙමින් සිටිති. යහපාලන සිදුවීමට පෙර අවම තරමින් රටේවත් නොසිටි එම පිරිස අද රටේ වැඩිම වැටුප්ලාභීන් වී සිටීම හාස්‍ය දනවනසුලූය. පසුගිය මාස 21 ක කාලය තුළ යහපාලන රජය වැඩිම අපවාදනයට ලක්වූයේ එම ආනයනික කිහිප දෙනා නිසා ය. රාජපක්ෂ සමයේ හතරේ පහරවල් නැවැත්වීමට, උඩ පන්දු රැකගැන්මට, කඩුලූ බිඳ හෙළීමට ගත් උත්සාහයන් පිළිබඳ අබමල් රේණුවක හෝ දැනුමක් නොමැති ඔවුහු අද දිගට හරහට තමන්ට අවශ්‍ය ආකාරයට පන්දුවට ඔහේ තඩිබාමින් සිටිති. මහින්ද රාජපක්ෂලාට යළි බලයට පැමිණිය ද





8 වන පිටට